# ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය

- හැඳින්වීම -

න්‍යෂ්ටික තාක්ෂණය යනු රටක සංවර්ධනය සඳහා ඉමහත් කාර්යභාරයක් ඉටු කළ හැකි තාක්ෂණික ක්ෂේත්‍රයකි. යෙදීම් වලින් අනූන එම තාක්ෂණය වෛද්‍ය විද්‍යාව, කෘෂිකාර්මික, කර්මාන්ත, බලශක්ති උත්පාදන සහ පාරිසරික යනාදී අංශ වල සංවර්ධනය සඳහා බහුලව යොදාගනු ලැබේ. ශ්‍රී ලංකාවේදී ඉහත අංශ සඳහා අවශ්‍ය වන න්‍යෂ්ටික තාක්ෂණික සේවා සැපයීම, එම තාක්ෂණය රට තුල ප්‍රචලිත කිරීම සහ න්‍යෂ්ටික ආරක්ෂණ ක්‍රමෝපායයන් පවත්වාගෙන යාම ශ්‍රී ලංකා පරමාණුක ශක්ති මණ්ඩලයේ වගකීමකි. එහිදී, සුරක්ෂිතතාවය සහ ආරක්ෂාව මුල් කොට ගෙන වඩා දියුණු, අන්තර්ජාතික මට්ටමේ ප්‍රමිතිකරණ ක්‍රමවේද හඳුනාගනිමින්, එම තාක්ෂණයේ සාමකාමී යෙදීම් ඔස්සේ රටේ අභිවෘද්ධිය උදෙසා දායක වීම ආයතනයේ පරමාර්ථය වේ. විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ශ්‍රී.ල.ප.බ.ම., ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ (International Atomic Energy Agency/IAEA) මෙරට ප්‍රධාන නියෝජිතයා ද වේ. ඒ අනුව, අන්තර්ජාතික මට්ටමේදී ශ්‍රී ලංකාව නියෝජනය කිරීම ද ශ්‍රී.ල.ප.බ.ම. යේ ප්‍රධාන වගකීමකි.

සමස්තයක් ලෙස, සමාජ-ආර්ථික සංවර්ධනය සඳහා න්‍යෂ්ටික තාක්ෂණය ප්‍රවර්ධනය කිරීම, විකිරණ සේවකයන්ගේ, මහජනතාවගේ සහ පරිසරයේ සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා අවශ්‍ය සේවා සැපයීම ශ්‍රී.ල.ප.බ.ම. යේ කාර්යය වේ. ඒ සඳහා අවශ්‍ය බලතල, ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත ඔස්සේ ආයතනයට පවරා දී තිබේ.

## 1 ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති අධිකාරිය, 1969 අංක 19 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති අධිකාරී පනත මගින් පිහිටුවන ලද ආයතනයකි. එම ආයතනය, 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නව පනත මගින්, ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය (Sri Lanka Atomic Energy Board) හා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව (Sri Lanka Atomic Energy Regulatory Council) ලෙස නව ආයතන දෙකක් වශයෙන් පිහිටුවන ලදී. එම නව පනත 2015 ජනවාරි මස සිට ක්‍රියාවට නැංවිණි.

## 2 ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ දැක්ම සහ මෙහෙවර

### 2.1 දැක්ම

න්‍යෂ්ටික විද්‍යාව හා තාක්ෂණය ඔස්සේ ජාතියේ තිරසාර සංවර්ධනය

### 2.2 මෙහෙවර

සුරක්ෂිතතාවය, ආරක්ෂාව සහ තත්ත්වය තහවුරු කරගනිමින්, න්‍යෂ්ටික තාක්ෂණයේ සාමකාමී යෙදවුම් ප්‍රවර්ධනය කිරීම, දිරිමත් කිරීම සහ සමාජ-ආර්ථික සංවර්ධනය සඳහා එහි ප්‍රතිලාභ උපයෝගී කර ගැනීම,
සහ,
විකිරණ සේවකයන්, මහජනතාව සහ පරිසරය අනවශ්‍ය ලෙස අයනීකරණ විකිරණ වලට නිරාවරණය වීම වැළැක්වීම සඳහා විකිරණ ආරක්ෂණ සේවා සැපයීම.

## 3 ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ අරමුණු

- න්‍යෂ්ටික තාක්ෂණයේ සාමකාමී යොදාගැනීම් ප්‍රවර්ධනය කිරීම සහ දිරිගැන්වීම සහ ඒ තාක්ෂණය උපයෝගී කරගෙන සේවා සැපයීම.
- ජාතික අරමුණු සාක්ෂාත් කරගැනීමේ කාර්යය සඳහා න්‍යෂ්ටික විද්‍යාවේ හා න්‍යෂ්ටික තාක්ෂණය පිළිබඳ සාමකාමී යොදාගැනීම් සම්බන්ධ පර්යේෂණ පැවැත්වීම.
- න්‍යෂ්ටික තාක්ෂණයේ සාමකාමී යෙදවුම් වල ප්‍රවේසම් සහිත බව සහ සුරක්ෂිත ක්‍රම සහ ගුණාත්වය තහවුරු කිරීම සඳහා කෙරෙන නව ක්‍රමෝපක්‍රම ප්‍රවර්ධනය කිරීම සහ ඒවාට ආධාර කිරීම.
- න්‍යෂ්ටික යොදාගැනීම් සම්බන්ධයෙන් නියාමන අවශ්‍යතා ඉටු කිරීම පිණිස විකිරණ ආරක්ෂාව සඳහා වන සේවා සැපයීම.
- වාණිජ හෝ වෙනත් කාර්ය සඳහා අයනීකාර විකිරණ හා අනුපූරක තාක්ෂණ සම්බන්ධිත ක්‍රියාකාරකම් වල නිරත වීම.

ඉහත අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා ශ්‍රී.ල.ප.බ.ම.ය විද්‍යාත්මක සේවා අංශ 04 කින්, ජාතික මධ්‍යස්ථාන 02 කින් සහ මූල්‍ය හා පරිපාලන අංශ වලින් සමන්විත වී තිබේ. එම එක් එක් අංශ වල වගකීම් හා ඒවායින් සැපයෙන සේවා පිළිබඳව කෙටි විස්තරයක් පහත දැක්වේ.

## 4 ජෛව විද්‍යා අංශය (Life Sciences Division)

- **න්‍යෂ්ටික විශ්ලේෂණ සේවා:** න්‍යෂ්ටික විශ්ලේෂණ සේවා අංශය පහත වගකීම් දරණු ලැබේ.
  - ආනයන හා අපනයන ආහාර ද්‍රව්‍ය වල විකිරණශීලිතා මට්ටම මැනීම සඳහා ආහාර පරීක්ෂණ සේවා සැපයීම (කිරිපිටි, ටින්මාළු සහ තේ කොළ යනාදිය).
  - පසේ, ජලයේ සහ ශාක වල විකිරණශීලිතා මට්ටම මැනීම සඳහා සේවා සැපයීම.
  - මිශ්‍ර ලෝහ, පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත නිර්මාණ සහ හඳුනානොගත් වස්තූන් (උල්කාෂ්ම කොටස්) යනාදියේ ලෝහ සංයුතිය නිර්ණය කිරීම සඳහා XRF සහ TXRF තාක්ෂණ ඔස්සේ විශ්ලේෂණ සේවා සැපයීම.
  - පර්යේෂණ නියැදි වල ශුද්ධ ඇල්ෆා ($\alpha$) හා බීටා ($\beta$) මිනුම්කරණය.

- **සමස්ථානික ජලවිද්‍යාව:** මෙහිදී න්‍යෂ්ටික තාක්ෂණය උපයෝගී කරගෙන ජල සම්පත් කළමනාකරණය සහ ඒවායේ ආරක්ෂාව උදෙසා තීන්දු තීරණ ගැනීමට අත්‍යවශ්‍ය වන දත්ත අදාළ ආයතන වෙත සැපයීම සඳහා පර්යේෂණ හා සේවා කටයුතු සිදු කෙරේ. මෙම පරීක්ෂණ සිදුකිරීම සඳහා ජලයේ ඇති සමස්ථානික ($^{18}O$, $^{2}H$, ට්‍රිටියම් ($^{3}H$) සහ රේඩෝන් ($^{222}Rn$) වැනි) විශ්ලේෂණය සඳහා වන පහසුකම් මෙන් ම ජලයේ ගුණාත්මක බව නිර්ණය කිරීමට අවශ්‍ය වන විශ්ලේෂක වලින් ද සමන්විත විද්‍යාගාර ශ්‍රී.ල.ප.බ.ම. තුළ ස්ථාපනය කර තිබේ. සමස්ථානික ජලවිද්‍යා වැඩසටහන විසින් පහත සඳහන් ක්ෂේත්‍ර කෙරේ වැඩි අවධානයක් යොමුකොට පර්යේෂණ සහ සේවා කටයුතු මෙහෙයවනු ලැබේ.
  - වියළි කලාපයේ පැතිර යන හඳුනා නොගත් නිධන්ගත වකුගඩු රෝගය සහ භූගත ජලයේ ඇති සම්බන්ධතාවය පිළිබඳව වැඩිදුර අධ්‍යයනය කිරීම.
  - මුහුදු ජලයෙන් වෙරළාශ්‍රිත භූගත ජල පද්ධති වලට වන බලපෑම අධ්‍යයනය කිරීම.
  - භාවිතයට ගත හැකි පිරිසිදු භූගත ජලය පොළව අභ්‍යන්තරයෙන් මුහුදට ගලා යන ස්ථාන නිරීක්ෂණය කර එම අපතේ යන ජල සම්පත කළමනාකරණයට අවශ්‍ය තොරතුරු සෙවීම.
  - භූ ජලයේ මූලාරම්භක ප්‍රදේශ, ගලා යන දිශා, ගමන් මග ආදිය නිවැරදිව සොයාගැනීම තුළින් ජල පෝෂක ප්‍රදේශ වල ආරක්ෂාවට අවශ්‍ය තොරතුරු සෙවීම.
  - ජල මූලාශ්‍ර දූෂණය වන දූෂ්‍යකාරක පිළිබඳ නිවැරදි තොරතුරු සෙවීම.
  - ජලාශ හා වේලි වල ජල කාන්දු සහ වැස්සීම් හඳුනාගැනීම.



## 5 විකිරණ ආරක්ෂණ සහ තාක්ෂණික සේවා අංශය (Radiation Protection & Technical Services Division)

- **න්‍යෂ්ටික යන්ත්‍රෝපකරණ සේවාව:** න්‍යෂ්ටික මිනුම්කරණ හා අනාවරණ උපකරණ අලුත්වැඩියා කිරීම, නව න්‍යෂ්ටික මිනුම් උපකරණ හා ආශ්‍රිත තාක්ෂණික ක්‍රමවේද නිර්මාණය සහ සංවර්ධනය කිරීම මෙහි සිදු කෙරේ. එමෙන්ම බාහිර ආයතන සඳහා තාක්ෂණික සහය සැපයීම ද මෙම අංශයෙන් සිදු වේ.
- **වෘත්තීමය විකිරණ නිරාවරණ පාලනය සහ පුද්ගල විකිරණමිතික සේවය:** පුද්ගල විකිරණමිතික සේවය, තාප-දීප්ත මාත්‍රාමාපක (Thermo-luminescence Deosimeters/TLD) මගින් විකිරණ සේවකයන් සඳහා බාහිර මාත්‍රාමිතික සේවා සැපයීම දීපව්‍යාප්ත මට්ටමෙන් සිදු කරනු ලැබේ. වෘත්තීමය විකිරණ නිරාවරණ පාලනය යටතේ විකිරණ මට්ටම් මැනීම සඳහා වැඩබිම් පරීක්ෂාව සහ ආරක්ෂණ ක්‍රමවේද අනුගමනය කළ යුතු ප්‍රදේශ හඳුනාගැනීම සිදුකෙරේ.
- **ද්විතියික සම්මත මාත්‍රාමිති ක්‍රමාංකනය (Secondary Standard Dosimetry Calibration):** ද්විතියික සම්මත ගැමා කදම්බය සහ වෛද්‍ය සම්මත X-විකිරණ කදම්බය පවත්වාගෙන යමින් විකිරණ මිනුම් උපකරණ සහ රෝග විනිශ්චය සඳහා භාවිතා කෙරෙන විකිරණවේද (diagnostic radiology) උපකරණ ක්‍රමාංකනය කිරීම සඳහා දීපව්‍යාප්ත සේවා සැපයීම.
- **හදිසි අවස්ථා සඳහා පෙර සූදානම සහ පාරිසරික අධ්‍යයනය:** ජාතික න්‍යෂ්ටික අනතුරු පූර්ව හඳුනාගැනීම් පද්ධතිය පවත්වාගෙන යාම සහ විකිරණ හදිසි අනතුරු අවස්ථා සඳහා විශේෂඥ සහය

ලබාදීම ද මෙම අංශය මගින් සිදුකෙරේ. පාදස්ථ ගැමා සහ රේඩොන් ක්‍රියාකාරීත්වයන් හඳුනාගැනීම සඳහා පාරිසරික අධ්‍යයන පවත්වාගෙන යාම ද මෙම අංශයේ වගකීමකි.

- **විකිරණ ආරක්ෂණය:** විකිරණශීලීතාවය භාවිතා කරන ස්ථාන ආරක්ෂිතව ඉදිකිරීම සඳහා තාක්ෂණික සේවා ලබාදීම, විකිරණ ආරක්ෂණය සඳහා පර්යේෂණ සිදුකිරීම සහ විකිරණ ආරක්ෂණ සේවකයන් පුහුණු කිරීම මේ යටතේ සිදු කෙරේ.
- **න්‍යෂ්ටික සුරක්ෂිතතාව සහ අපද්‍රව්‍ය කළමනාකරණය:** විකිරණ ආරක්ෂාව සඳහා ඉදිරිපෙළ ආරක්ෂණ නිලධාරීන් පුහුණු කිරීමට විශේෂඥ සහාය ලබාදීම, විකිරණ අනාවරණ හැකියාවන් හා ඒ ආශ්‍රිත ක්‍රමවේද වැඩිදියුණු කිරීම මෙන්ම භාවිතාවෙන් ඉවත් කළ විකිරණ ප්‍රභව ගබඩාව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය තාක්ෂණික සහ භෞතික පහසුකම් සංවර්ධනය කිරීම ද මෙහිදී සිදුකෙරේ. එමෙන්ම, නියාමන පාලනයෙන් තොර ද්‍රව්‍ය සඳහා විකිරණ ආරක්ෂාව වැඩිදියුණු කිරීමට අවශ්‍ය අනතුරු ඇඟැවීම් ක්‍රම සංවර්ධනය කිරීමට පර්යේෂණ කිරීම ද මෙම අංශයේ ම වගකීමකි.
- **තොරතුරු තාක්ෂණ සේවා:** ආයතනයේ තොරතුරු තාක්ෂණික ජාල සේවා (නිල වෙබ් අඩවිය, විද්‍යුත්-ලිපි සේවාව සහ අභ්‍යන්තර ජාලය) සහ ඒ ආශ්‍රිත දෘඩාංග පවත්වාගෙන යාම සහ අලුත්වැඩියා කිරීම.



## 6 විකිරණ තාක්ෂණ යෙදවුම් අංශය (Radiation Technology Applications Division)

- **විකිරණ පිරිසැකසුම (Radiation Processing):** විකිරණ පිරිසැකසුම් අංශය මගින් අයනීකරණ විකිරණ භාවිතයෙන් වෙළඳපොල ද්‍රව්‍ය වලට අගය එකතුකිරීම සඳහා පර්යේෂණ මෙහෙයවීම සිදුකෙරේ.
    - විකිරණ මගින් පිරිසැකසුම් කල කයිටෝසාන් (ස්වභාවික බහුඅවයවිකයකි) ව්‍යුත්පන්න මගින් නව නිෂ්පාදන බිහිකිරීම (පැළෑටි වර්ධන ප්‍රවර්ධක, දිලීර නාශක).
    - වියළි කලාපයේ වගා බිම් වල පාංශු ජල ධාරිතාව ඉහල නැංවීම අරමුණු කොට ගත් සුපිරි ජල-අවශෝෂක ද්‍රව්‍ය වැඩිදුර සංවර්ධනය කිරීම.
    - විකිරණ පිරිසැකසුම් සහ අංශ වල පර්යේෂකයන් සහ බාහිර ආයතන සඳහා ප්‍රවිකිරණ සේවා සැපයීම.
    - වැඩමුළු සහ සම්මන්ත්‍රණ ඔස්සේ විකිරණ පිරිසැකසුම පිළිබඳ දැනුම බෙදාහැරීම.

- **ආහාර සහ කෘෂිකර්මාන්තය:** මෙමගින් රටේ කෘෂිකාර්මික කටයුතු සඳහා අයනීකරණ විකිරණ භාවිතා කළ හැකි ආකාරය පිළිබඳව පර්යේෂණ මෙහෙයවීම සිදුකෙරේ. කෘෂිකාර්මික පර්යේෂණ ආයතන සමග සහයෝගීතාවයෙන් යුතුව, නව බෝග ප්‍රභේද සහ ආශ්‍රිත සැකසුම් ක්‍රමවේද සංවර්ධනය කිරීම ද මෙම අංශය යටතේ සිදු වේ. එම සංවර්ධන කටයුතු පහත අරමුණු ඔස්සේ මෙහෙයවනු ලැබේ.
    - ගොවීන්ගේ ජීවන තත්වය ඔප්නැංවීම සඳහා කෘෂිකාර්මික ඵලදායිතාවය ඉහළ නැංවීම, පාංශු සංරක්ෂණය සහ ජාල මූලාශ්‍ර වල තිරසාර භාවිතය.
    - විකිරණ භාවිතයෙන් ආහාර කල්තබාගැනීමේ හැකියාව වර්ධනය කිරීම සහ හානිකර ක්ෂුද්‍රජීවීන් ඇතුළු වෙනත් පලිබෝධකයන් විනාශ කිරීම (පුළුල් ප්‍රදේශයක ක්‍රියාත්මක කෙරෙන ඒකාබද්ධ පලිබෝධ කළමනාකරණ ක්‍රම මගින්).
    - දේශගුණ විපර්යාස සහ විචලතාවයන්ට එරෙහිව පාංශු ප්‍රත්‍යස්ථතාවය (soil resilience) සහ ගුණාත්මක බව ඉහල නැංවීම.
    - ආහාර සහ කෘෂි නිෂ්පාදන වල තත්වය සහ සුරක්ෂිතතාව තහවුරු කිරීම.



## 7 නිර්විනාශක පරීක්ෂණ පිළිබඳ ජාතික මධ්‍යස්ථානය (National Center for Non-destructive Testing)

ද්‍රව්‍ය වලට හානි කිරීමකින් හෝ වැය වීමකින් තොරව ද්‍රව්‍ය වල භෞතික පිරික්සීම් සිදුකිරීමේ ක්‍රියාවලි නිර්විනාශක පරීක්ෂණ නම් වේ. නිෂ්පාදන තත්ත්වය පිරික්සීමට සේවාවන් වල සහ නිරන්තර නඩත්තු හා පිරික්සුම් ක්‍රියාවලි වලදී මෙම තාක්ෂණය බහුලව භාවිතා වේ. එබැවින්, නිර්විනාශක පරීක්ෂණ යනු කාර්මික උපාංග, එකලස් කිරීම් සහ ව්‍යුහ වල තත්ත්ව පරීක්ෂා කටයුතු සඳහා ඉතා වැදගත් මෙවලමකි. නිර්විනාශක පරීක්ෂණ පිළිබඳ ජාතික මධ්‍යස්ථානය එවැනි සේවා ගණනාවක් සපයනු ලැබේ.

- **නිර්විනාශක පරීක්ෂණ තාක්ෂණවේදීන් පුහුණු කිරීම:** මෙම මධ්‍යස්ථානය මගින් ISO 9712 සම්මතයට අනුරූපීව, නිර්විනාශක පරීක්ෂණ ක්‍රමවේද 05 ක් සඳහා, නිපුණතා මට්ටම් 03 ක් යටතේ තාක්ෂණික ශිල්පීන් පුහුණු කිරීම සිදු කෙරේ.
  - විකිරණරේඛන පිරික්සුම් (Radiography Testing/RT)
  - අතිධ්වනි පිරික්සුම් (Ultrasonic Testing/UT)
  - සුළිධාරා පිරික්සුම් (Eddy Current Testing/ET)
  - චුම්බකිත අංශු පිරික්සුම් (Magnetic-particle Testing/MT)
  - ද්‍රව කාන්දු පිරික්සුම් (Penetrant Testing/PT)
- **නිර්විනාශක පිරික්සුම් සේවා සැපයීම:** විදුලි බලාගාර, බොයිලේරු, නෞකා, ගුවන්යානා හා පාලම් ඉදිකිරීම් කටයුතු සඳහා ඉහත ක්‍රමවේද යටතේ සහ ගොඩනැගිලි ඉදිකිරීම් වල කොන්ක්‍රීට් පිරික්සුම් කටයුතු සඳහා දීපව්‍යාප්ත සේවා ලබාදීම.
- **නිර්විනාශක පරීක්ෂණ තාක්ෂණවේදීන් සහතික කිරීම:** නිර්විනාශක පරීක්ෂණ තාක්ෂණවේදීන්ගේ සුදුසුකම් ඇගැයීම සහ ISO 9712 තත්ත්ව සහතිකය යටතේ, ඉහත පිරික්සුම් ක්‍රම සඳහා ඔවුන්ට නිපුණතා සහතික නිකුත් කිරීම ද මෙම මධ්‍යස්ථානයෙන් සිදුවේ.



## 8 ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය (Sri Lanka Gamma Center)

ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය, ශ්‍රී.ල.ප.බ.ම. ට අයත් ISO 9001:2008 තත්ත්ව සහතික ලත් බහුකාර්ය ගැමා ප්‍රවිකිරණ යන්ත්‍රාගාරයකි (Multi-purpose Gamma Irradiation Facility). වර්ෂ 2014 ජනවාරි මස සිට එය ක්‍රියාත්මක වන අතර, රටේ සෞඛ්‍ය සහ ආහාර පිරිසැකසුම් අංශ සඳහා සේවා සැපයීම එහි ප්‍රධාන වශයෙන් සිදු කෙරේ. එසේම එය ගැමා ප්‍රවිකිරණය සඳහා වන ජාතික මධ්‍යස්ථානය ලෙසත්, ගැමා පිරිසැකසුම් සේවා සඳහා පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය ලෙසත් සේවා සපයනු ලැබේ. ඉන් සිදුකෙරෙන සේවා අතර,

- ISO 13485 තත්ත්ව සහතිකයට අනුකූලව පහත සඳහන් ද්‍රව්‍ය ජීවානුහරණය කිරීම.
  - වරක් පමණක් භාවිතා කෙරෙන වෛද්‍ය නිෂ්පාදන (Disposable medical products) - සිරින්ජ, එන්නත් කටු, කැතීටර සහ රුධිර පාරවිලයන උපකරණ
  - ශල්‍ය වෛද්‍ය නිෂ්පාදන - අත්වැසුම්, සීවන (Sutures), සැත්කටු, සැත්පිහි තල, ඒප්‍රන සහ මුඛවාඩම්
  - සෙලියුලෝස් නිෂ්පාදන - පුළුන්, තුවාල ආවරණ රෙදි (Dressings), දැල් රෙදි, එතුම් පටි
  - ඖෂධ සහ බහාලුම් - ඇස් සහ පිළිස්සුම් ආලේපන, ප්‍රතිජීවක, තුවාල සේදුම් සඳහා ජලය, බහාලුම්, බිංදුකර (Droppers)
  - විද්‍යාගාර සැපයුම් - පෙට්‍රි දීසි, රෝපණ ප්ලාස්කු, රුධිරය ලබාගන්නා නළ, මූත්‍රා සාම්පල බඳුන්
  - රූපලාවන්‍ය හා සනීපාරක්ෂක නිෂ්පාදන - සැත්කම් පුයර, ළදරු කිරි බෝතල් පුඩු, මුහුණු ආලේපන, සනීපාරක්ෂක තුවා
  - ජීව විද්‍යාත්මක ද්‍රව්‍ය - පටක, රෝපණ මාධ්‍ය සඳහා ශීතකළ මස්තු (Serum), රුධිර පටක ව්‍යුත්පන්න

- කුළුබඩු, රසකාරක ද්‍රව්‍ය, වියළන ලද එළවලු, ඖෂධ පැළෑටි, ආයුර්වේද නිෂ්පාදන සහ අතිරේක පෝෂණ ආහාර ද්‍රව්‍ය නිර්දූෂණය (Decontamination) කිරීම.
- කෘෂි නිෂ්පාදන, දැවමුවා නිර්මාණ, කොහු සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන නිරෝධායනය (Quarantine) කිරීම.
- ශීතකළ,නැවුම් හෝ වියළන ලද මත්ස්‍ය නිෂ්පාදන පාස්චරීකරණය කිරීම.
- රබර් වල්කනයිස් කිරීම.
- එළු, සුදු එළු සහ අර්තාපල් වල අංකුර ඇතිවීම වැළක්වීම.
- පර්යේෂණ හා සංවර්ධන සේවා සහ ක්ෂුද්‍රජීව පරීක්ෂණ සේවා සැපයීම.

ආදිය වේ.







## 9 අන්තර්ජාතික සහයෝගීතා සහ න්‍යෂ්ටික දැනුම් කළමනාකරණ අංශය (International Cooperation and Nuclear Knowledge Management Division)

ශ්‍රී.ල.ප.බ.ම.ය අන්තර්ජාතික පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ (IAEA) මෙරට නියෝජිතයා වන නිසාම, එම ආයතනය සහ වෙනත් රටවල් මගින් සංවිධානය කෙරෙන කටයුතු සමායෝජනය කිරීම සහ අවශ්‍ය අවස්ථා වලදී පහසුකම් සැපයීම මෙම අංශයේ වගකීම වේ. මෙම අංශයෙන් සිදුකෙරෙන මූලික කටයුතු පහත පරිදි වේ.

- අන්තර්ජාතික සහයෝගීතාවය මගින් න්‍යෂ්ටික තාක්ෂණික දැනුම හුවමාරු කිරීම.
- IAEA හි තාක්ෂණික සහයෝගීතා ව්‍යාපෘති, වෙනත් ද්විපාර්ශ්වික හා බහුපාර්ශ්වික වැඩසටහන් සහ කලාපීය සහයෝගීතා ගිවිසුම් ක්‍රියාත්මක කිරීම, කළමනාකරණය සහ අධීක්ෂණය කිරීම.
- IAEA හෝ වෙනත් ආයතන මගින් සංවිධානය කෙරෙන වැඩමුළු, සමළු, පුහුණු වැඩසටහන්, පර්යේෂණ සැසිවාර ආදිය සඳහා ශ්‍රී ලාංකික විද්‍යාඥයන්ට සහභාගී වීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.
- ශ්‍රී ලංකාව තුළ වැඩසටහන් සංවිධානය කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම මගින් අන්තර්ජාතික පරමාණුක බලශක්ති නියෝජිතායතනයට සහය දැක්වීම.
- අන්තර්ජාතික පරමාණුක බලශක්ති නියෝජිතායතනය වෙත ශ්‍රී ලංකාවට ඇති මූල්‍යමය බැඳීම් පූරණය කිරීම සඳහා අදාළ අමාත්‍යංශ සමග කටයුතු සමායෝජනය කිරීම.
- ශ්‍රී.ල.ප.බ.ම. යේ පුස්තකාලය පවත්වාගෙන යාම සහ සංවර්ධනය කිරීම.
- දේශීය ප්‍රජාව සඳහා න්‍යෂ්ටික දැනුම බෙදාහැරීමේ වැඩසටහන් සංවිධානය කිරීම සහ ඊට අවශ්‍ය පහසුකම් සැපයීම.







## 10 පරිපාලන හා ප්‍රසම්පාදන අංශය සහ මූල්‍ය අංශය (Administration & Procurement Division and Finance Division)

මෙම අංශ මගින්, ආයතනික අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය මූල්‍යමය, මානව සම්පත්, සහ සැපයුම් හා කළමනාකරණ සේවා ලබාදීම මගින් අනෙකුත් සියලුම අංශ වලට සහය දැක්වීම සිදුකෙරේ.